# පුරාණ දෝරදත්තික අමුණ

චන්දන රෝහණ විතානච්චි
*කථිකාචාර්ය*
*පුරාවිද්‍යා අධ්‍යයන අංශය*
*ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය*
*මිහින්තලය*

අනුරාධපුර රාජධානිය බිඳ වැටීමත් සමග පිරිහී ගිය ලක්දිව වාරිකර්මාන්තයේ උච්චතම අවස්ථාව පිළිබිඹු වනුයේ 1වන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේදිය. දිවයිනේ අග රජු වීමේ අභිප්‍රාය සඵල කරගැනීම සඳහා ඔහුට පිටිවහල් වූයේ දක්ඛිණ දේශයය. රටේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහා දක්ඛිණ දේශයේ කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීමට අදහස් කල රජු එම ප්‍රදේශයේ ප්‍රධාන ජල මාර්ගය වූ ජජ්ජර නදිය (දැදුරු ඔය) ආශ්‍රිතව වාරිමාර්ග තැනීම කෙරෙහි යොමුවිය.[1] දැදුරු ඔය ස්ථාන තුනකින් හරස්කර අමුණු බැඳ ගොවිතැනට අවශ්‍ය ජලය සපයාදීමට හෙකෙම මෙම කාලයේදී පියවර ගෙන තිබේ.

. අහසින් වැටෙන දිය බිඳක් පවා මනුෂ්‍ය ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා නොයා යුතුය. .

යන ප්‍රකාශය පරාක්‍රමබාහු රජු විසින් කරන ලද්දේ දැදුරු ඔය ආශ්‍රිත වාරිකර්මාන්ත ආරම්භ කරන අවස්ථාවේදිය. චූලවංශයේ මේ රජු විසින් ඉදිකරන ලද අමුණු හතරක් පිළිබඳව තොරතුරු සඳහන් වේ. මින් කොට්ඨ බද්ධල සූකරනිජ්ජ හා දෝරදත්තික යන අමුණු හෙතෙම දක්ඛිණ දේශයේ පාලකයාව සිටි සමයේදී ද[3] ජජ්ජර නිජ්ජර අමුණ පොලොන්නරුවේ රාජප්‍රාප්ත වූ පසුව ද ඉදිකර තිබේ [4].

චූල වංසයේ සඳහන් වන ප්‍රධාන අමුණු අතරින් අවසාන අමුණ වන්නේ දෝරදත්තික අමුණයි.

> . දැදුරු ඔය මැද දෝරදත්තික නම් තැන දිය බස්නාවක් ද මහ ඇලක් ද කරවා
> එතැන් සිට ඌරුදොළ දක්වා කෙත් කරවා .........

යනුවෙන් චූලවංසයේ මෙම අමුණ ඉදිකිරීම සම්බන්ධයෙන් විස්තර කර ඇත. [5] මේ අනුව ඔයේ මධ්‍ය ප්‍රදේශයක මෙම අමුණ ඉදිරිකර තිබෙන බවත්ල එමගින් සූකර නිජ්ජර අමුණ නෙක් වූ ප්‍රදේශයට ජලය ගෙනවිත් අවට ප්‍රදේශයේ කෘෂි කර්මන්ත කටයුතු සිදුකළ බවත් පැහැදිලි වේ. වංසකතාවේ දැක්වෙන තොරතුරු අනුව මෙම අමුණ සූකර නිජ්ජර අමුණට ඉහලින් පිහිටා තිබිය යුතුය.

හක්වටුවාන ඔය සහ කිඹුල්වානා ඔය දැදුරු ශයට සම්බන්ධ වන දෙමෝදර නම් වූ ස්ථානය ආසන්නයේ ගල් රැණ නමින් හඳුන්වන ස්ථානයේ කළ ගවේපනය මගින් පුරාණ අමුණක් තිබුණු බවට සාක්ෂි සොයා ගැනීමට හැකිවිය. මෙම ස්ථානය දැදුරු ඔයේ දකුණු ඉවුරේ

පහළයාය හා වම් ඉවුරේ වල්පාලුව නම් ගම්මාන දෙකට මැදිව පිහිටා තිබේ. මෙම ස්ථානයේ තිබෙන නටඹුන් චූලවංශයේ සඳහන් තොරතුරු හා සසඳන කළ පැහැදිලි වන්නේ එම ජලය මගින් සූකර නිජ්ජර අමුණ ආසන්න ප්‍රදේශය දක්වා කෘෂි කර්මාන්ත කටයුතු කළ බවයි. මෙය චූලවංසයේ පුවත හා සැසඳේ. අමුණේ දකුණු ඉවුරෙන් කපා තිබෙන ඇළ මාර්ගය දළ ඒ අවට ප්‍රදේශයට පමණක් ජලය සැපයීම පිණිස කර තිබෙන බව පැහැදිළ වේ. මේ අනුව මෙම ස්ථානයේ තිබෙව නටඹුන් දෝරදන්තික අමුණට අයත් බව නිගමනය කිරීමට පිළිවන.

ගල් රැත නම් වූ ස්ථානයේ දැදුරු ඔය මීටර් 110 ක පමණ පළලකින් යුක්තය. එහි වම් හා දකුණු ඉවුරු ආසන්නයෙන් ජලය ගලාබසින අතර මැද ස්වාභාවික දූපතක ලක්ෂණ ඇත. මෙම දූපතේ ඉහළ කෙළවර සීමාවන්නේ මීටර් 5. 50 ක් පමණ උසැති මීටර් 40 ක් පමණ පළලැති ගල් පර්වතයකිනි. එය ඔය පහළට හා දෙපසට බෑවුම් වන ස්වරූපයකින් ඔය දෙසට බෑවුම් වේ. (ඡායාරූපය 1)

මෙම ස්ථානයේ භෞතික පිහිටීම අමුණක් ඉදිකිරීමට වඩාත් යෝග්‍ය බව පෙනේ. මෙවැනි ස්ථාන තෝරාගැනීම සම්බන්ධයෙන් පුරාණ වාරි ශිල්පීන් තුළ වූ දැනුම මෙහි දී සැලකිල්ලට ගැනීම අගනේය. වර්තමානයේ දී මෙම අමුණේ ඉතිරිව තිබෙන නටඹුන් ප්‍රමාණය 5 ටත් වඩා අඩුය. එම නටඹුන් ප්‍රමාණය ද ඉතිරිව ඇත්තේ වම් ඉවුරට ආසන්නයේ වන අතර එයින් ද වැඩි කොටසක් ස්වාභාවික ගලේ කපන ලද කැපුම් සළකුණු ලෙස හඳුනාගැනීමට පිළිවෙන.

මෙම අමුණ ඉදිකිරීම සඳහා ඔය මධ්‍යයේ හා වම් ඉවුරේ පිහිටි ස්වාභාවික ගල් තලාව උපයෝගි කරගෙන තිබෙන බව ගවේෂණය මගින් පැහැදිලි විය. විවිධ ස්වාභාවික ගලේ කපන ලද කැපුම් සළකුණුවලට හිරකර මෙම අමුණ ගොඩනගා තිබේ. තැන තැන විසිරී තිබෙන ඇතැම් ගල් පුවරුවල විශාලත්වය අනුව නිගමනය කළ හැකි වන්නේ සෘජුවම ජල ප්‍රවාහයට මුහුණ දීමට හැකිවන ආකාරයෙන් වඩාත් බර ගල් පුවරුවලින් අමුණු බැම්ම ඉදිකර තිබෙන බවට. මෙහි තිබෙන සකසන ලද ඇතැම් ගල් පුවරු ටොන් 15-20 අතර බර ප්‍රමාණයන්ගෙන් යුක්තය. අමුණ සඳහා යොදාගනු ලැබූ විශාල ගල් පුවරු කිහිපයක් මූල් ස්ථනයෙන් බැහැරව අක්‍රමවත් ආකාරයෙන් විසිරී තිබේ. (ඡායාරූපය 2)

මෙෙ අමුණ ඉදිකිරන සහය වන විට මෙම ස්ථානයේ දැදුරු ඔය වඩාත් පටු ස්වරූපයකින් යුක්තව වූ බව සිතීමට පුළුවන. ඔය මධ්‍යයේ තිබෙන දූපත එකළ නොතිබෙන්නට ඇත. පශ්චාත් කාලීනව දැදුරු ශයේ ගමන් මග වෙනස්වීම නිසා එය නිර්මාණය වූ බව පෙනේ. අමුණ ඉදිකරන ලද සමයේ මෙම ස්ථානයේ දි ඔය පළලින් අඩුවන්නට ඇති බවට හේතූන් රාශියක් ඉදිරිපත් කළ හැකිය.

අමුණ ඉදිකිරීම සම්බන්ධයෙන් වන සාක්ෂි දක්නට ඇත්තේ ඔයේ වම් ඉවුරේ පමණි. එහි මතු වී තිබෙන ස්වාභාවික ගල් තලාවේ මෙන්ම ජලයෙන් යටවී තිබෙන කොටසේ ද එවැනි නටඹුන්

හඳුනාගත හැකිය. ඇතැම් ස්ථානවලින් මතු වී තිබෙන ස්වාභාවික ගල් තලාවේ අමුණ රැඳවීමට යොදාගනු ලැබූ කැපුම් සලකුණු දකින්නට තිබේ. දකුණු ඉවුරේ අමුණේ කොටසක් පිහිටා තිබුණේ නම් එම ගල්තලාවල හෝ මධ්‍යයේ පිහිටි ගල් පර්වතයේ දකුණු කෙළවරේ බැම්ම ස්වාභාවික ගල් තලාවට සම්බන්ධ කර තිබුණු බවට කැපුම් සලකුණු තිබිය යුතු නමුත් එවැනි කිසිම සාධකයක් දක්නට නොමැත.

දිර්ඝ කාලයක් තුළ ජලය ගලාගෙන යාම නිසා වම් ඉවුරට ආසන්නයේ තිබෙන ගල් වඩාත් ගෙවිගිය ලක්‍ෂණ පෙන්නුම් කරයි. දකුණු ඉවුරේ ගල්වල එවැනි ගෙවිගිය ලක්‍ෂණ ඇත්තේ අල්ප වශයෙනි. මුල් කාලයේ දී දකුණු ඉවුරින් ජලය ගලා නොගිය බවට මෙය ද සාධකයකි. වම් ඉවුර ස්වාභාවික ගල් දක්වා හැරී තිබීමත්ල දකුණු ඉවුර එතරම් ගැඹුරු නොවීමත් තවත් ලක්‍ෂණයකි. මෙවන් කරුණු පරීක්‍ෂා කිරීමේ දී පැහැදිලිවන්නේ ඔයේ දකුණු ඉවුර අතීතයේ දී තිබී ඇත්තේ වර්තමාන ස්ථානයේ නොව දූපක දකුණු කෙළවර ආසන්නයේ වන බවයි. ඒ උපකල්පනය මත අතීතයේ දී මෙම ස්ථානයේ දැදුරු ඔයේ පළල මීටර් තිස්පහක් පමණ වන්නට ඇත.

වම් ඉවුරේ ජලය ගලාගෙන යන කොටස හරස් වන පරිදි දකුණු දෙසින් පිහිටි විශාල ගල් පර්වතය ද සම්බන්ධකර අමුණ බැඳීම නිසා සැඩපහර අධික ගංවතුර වැනි අවස්ථාවල දී ජලයල විශාල ගල් පර්වතයේ දකුණු දෙසින් බැසයන්නට ඇත. මේ හේතුවෙන් ඇති වූ බාදනය නිසා මෙම ස්ථානයේ මැද දූපතක් ඉතිරි කරමින් වර්තමානයේ පවතින ආකාරයෙන් දැදුරු ඔය පළල් වන්නට ඇති අතරල දෙපසින් ගලායාම ද ආරම්භ වන්නට ඇත.

ප්‍රදේශවාසීන් අදහස් දක්වමින් පවසන්නේ මීට දශක කිහිපයකට පෙර දැදුරු ඔය මෙතරම් පළල් නොවූ බවත්ල අසීමිත ලෙස වැලි ගොඩදැමීම නිසා ඇතිවන බාදනය හේතුවෙන් වර්තමානයේ දී ඔය මෙතරම් පළල් වූ බවත්ය. මේ නිසා ඔයේ මුල් ස්වාභවය සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇත. අමුණට ආසන්නව ඔයේ දකුණු කොටස වඩාත් පළල් වීම කෙරෙහි මෙම කාරණය ද බලපාන්නට ඇත.

වර්තමාන ඔයේ දකුණු ඉවුරේ හෝ ඒ ආසන්නයේ තිබෙන ගල් තලාවේ හෝ අමුණක් තිබුණු බවට සාධක නොමැත. දකුණු ඉවුර ආසන්නයේ දී ස්වාභාවික ගල් තලාව තරමක් ගැඹුරින් පිහිටා තිබෙන බව කරුණු ලැබූ ගවේෂනයෙන් තහවුරු විය. මෙය අමුණක් කිරීමට යෝග්‍ය තත්ත්වයක් නොවේ. දකුණ ඉවුර ආසන්නයේ අමුණේ කොටසක් හෝ තිබුණේ නම් එය බිඳිගිය විට විසිරිගිය ගල් කුට්ටි ඔය පහළ ප්‍රදේශයේ රැඳී තිබිය යුතුය. එහි එවන් සාධක සොයාගැනීමට නොමැත. එහෙත් වම් ඉවුරේ එලෙස ගැලවී ගිය ගල් කුට්ටි දකින්නට ලැබේ. මේ අනුව පැහැදිලි වන්නේ දකුණු කොටසේ අමුණක් ඉදිකිරීම සම්බන්ධයෙන් සාධක නොමැති බවයි. මෙම තොරතුරු නිරීක්‍ෂණය කරන විට එළඹිය හැකි නිගමනය වන්නේ  දකුණු ඉවුරේ කොටසක් නොතිබුණු බවත් එය එම ස්ථානය ගොඩබිම ලෙසින් අමුණ ඉදිකළ සමයේ දී පැවතුණු බවත්ය.

## <u>අමුණේ නටබුන්</u>

වම් ඉවුරේ සිට මධ්‍යයේ පිහිටි ගලේ දකුණු කෙළවර තෙක් මීටර් 16 ක පමණ පරතරයක් තිබේ. පුරාණ අමුණ සම්බන්ධයෙන් ශේෂව ඇති නටබුන් ස්වල්පය තිබෙන්නේ මෙම ස්ථානයේ ය. මෙහි වම් ඉවුරේ ස්වාභාවික ගල් තලාවේ පියගැට පෙළක ආකාරයෙන් කැපුම් සළකුණක් දැකිය හැකිය (ඡායාරූපය 3). මෙම කැපුම් සළකුණ ඉවුරේ සිට ඔය දෙසට ගලේ කෙළවර දක්වා මීටර් 4. 33 දිගකින් යුක්තය. ඉහළින්ම පිහිටි කැපුම් සළකුණ කුඩා කට්ටයක් ලෙස නිර්මාණය කර තිබෙන අතරල එය ඔය දෙසට සෙ. මී. 25 ක දිගකින් යුතුය. පළල සෙ. මී. 28 කි. දෙවැනි කැපුම් සළකුණ එතැන් සිට සෙ. මී. 295 ක් ඔය දෙසට ගමන් කර සෙ. මී. 24 කින් පමණ ඉහළට හැරී නිමවෙයි. තෙවැනි කැපුම් සළකුණ රතැනින් ඇඹෙන අතර එය සෙ. මී. 66 ක් දිගට ගමන් කරයි. මෙම කට්ටයේ පළල සෙ. මී. 48 කි. ඔය දෙසට වන්නට මෙම කැපුම් සළකුණුවල ගැඹුර ක්‍රමයෙන් වැඩිවන අතරල මේ වන විට සෙ. මීත 11 ක ගැඹුරකින් යුක්ත වේ. අවසන් කැපුම් සළකුණ සෙ. මීත 47 ක දිගකින් යුතුවන අතරල පළල ද එම ප්‍රමාණයෙ වේ. මෙම කැපුම් සළකුණ යෙදීම මගින් ගලේ බෑවුම් ස්වභාවය ඉවත් කර එම තිරු සමතලාවී ඇත. මේ නිසා අමුණේ ගල් පුවරු පහළට තල්ලුවීම වැළකෙන පරිදි රඳවාලීමට හැකියාව ලැබේ.

මෙම ගල් තලාවේ ජලයට යටවී තිබෙන සෘජු බෑවුම් සහිත කොටසෙහි ආයත චතුරස්‍රාකාර සිදුරු දෙකක් නිර්මානය කර තිබේ. මින් ඉහළින් පිහිටි සිදුරු සෙ. මී. 45 ක් උස වන අතරල පළල සෙ. මී. 27 කි. මෙහි ගැඹුර සෙ. මී. 10 කි එම සිදුරට සෙ. මී. 13 ක් පමණ පහළින් තවත් කැපුම් සිදුරක් තිබෙන අතර එහි දිග සෙ. මී. 26 කි. උස හා ගැඹුර සෙ. මී. 12 ක් පමණ වේ. මෙම සිදුරු පිහිටා තිබෙන ආකාරය අනුව අනුමාන කළ හැක්කේ මෙම ස්ථානයේ තිබෙන්නට ඇති ගල් පුවරු පහළට තල්ලුව යාම වැළකෙන ආකාරයෙන් රඳවාලීමට උත්සාහයක් ගත් බවයි.

ගල් තලාවේ ජලයට යටවී තිබෙන පහළම කොටසෙහි ගලේ උඩු අතට සෙ. මී. 80 ක දිගකින් යුතු කැපුම් සළකුණකි. එය සෙ. මී. 10 ක් පමණ සමතලා ලෙස හාරා තිබෙන අතරල කැපුමේ උස සෙ. මී. 55 ක් පමණ පමළට වන්නට එහි බෑවුමේ සිදුරක් හාරා තිබේ. මෙම සිදුරේ දිග සෙ. මී. 26 ක් වන අතරල ගැඹුර සෙ. මී. 10 කි. මෙම සිදුර ඉහළින් විවෘතව වේ. මෙම කැපුමේ ස්වාභාවය අනුව පැහැදිලි වන්නේ මෙම ස්ථානය විශාල ගල් පුවරුවක් රඳවාලීමට අවශ්‍ය ආකාරයෙන් සකසා තිබෙන බවයි. මෙම ස්ථානයට යෙදිය හැකි ආකාරයේ විශාල ගල් පුවරුවන් ඊට පහළින් රැදී තිබේ. එහි තිබෙන කැපුම් සළකුණුවල ස්වාභාවය මෙම ස්ථානයට ගැලපෙන බව ද පැහැදිලිය.

කැපුම් සළකුණු යොදා තිබෙන ආකාරය අනුව නිගමනය කළ හැක්කේ අමුණු බැම්ම පිහිටි ගලේ සිට ආරම්භ වී ඇති බවය. මුලින් සඳහන් ගලට විරුද්ධ දෙසින් මීටර් 1. 40 ක් පමණ දුරැත් ඔය මැද තිබෙන ගලක සෙ. මී. 90 ක දිගින් යුතුව උඩු අතට විහිදෙන කැපුම් සළකුණකි. මෙම කැපුම් සළකුණ පරීක්‍ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ මීටරයකට ආසන්න විශාලත්වයෙකින් යුතු ගල් පුවරුවක් මෙම ස්ථානය සඳහා යොදාගන්නට ඇති බවය.

ස්වාභාවික ගල් තලාව වම් ඉවුර දෙසට ව්‍යාප්ත වන අතර එහි සම්පූර්ණයෙන් ම කාණුවක ස්වරූපයෙන් කැපුම් සලකුණු යොදා තිබෙන ආකාරය පෙනේ. මෙහි වමඳ කෙලවරේ ඇතුළට හාරන ලද සිදුරකි. මෙහි දිග ල පළල අසමාන වන අතරල පැත්තක් සෙ. මී. 34◦37◦30◦37 ප්‍රමාණයෙන් යඅක්තය. මෙහි සෙ. මී. 15 ක පමණ ගැඹුරක් පවතී. එහි වම් කෙලවරින් අරඹෙන කැපුම් සලකුණ සෙ.. මී. 51 ක පළලින් යුක්ත වන අතර දිග දෙපසින් අසමාන වේ. පහළින් සෙ. මී. 98 ක් දල ඉහළින් සෙ. මීත 54 ක් ද වේ.

ඉහත සඳහන් කැපුම් සලකුණු කෙලවරින් තවත් කැපුම් සලකුණක් ආරම්භ වන අතර එය ආරම්භයේ දිම සෙ. මීත 10 දිගකින් හා සෙ. මී 4 ක පළලින් යුතු සිදුරක් ඇත. එය මූල් සලකුණ දෙසට විවෘත වන පරිදි සකසා තිබේ. වම් දෙසින් පිහිටි ස්වාභාවික ගලේ ස්වාභාවය අනුව කාණුවක් බඳුවූ මෙම කැපුම් සලකුණේ දිග දෙපසින්ම සමාන නොවේ. එය පහළින් සෙ. මී. 89 කි. එහෙත් ඉහළින් එය අඛණ්ඩව විහිද නොයන අතර සෙ. මී. 58 ක පමණ දිගකින් පසු සෙ. මී. 4 ක් පමණ උඩු අතට ගොස් නැවත වම් දෙසට හැරී සෙ. මී. 52 ක් ලමන් කරයි. එය ස්වාභාවික ගලෙහි සිදුරක් ඇතිවන පරිදි ඇතුළට හාරා ඇත. මෙම සිදුරේ පළල සෙ. මීත 36 ක් වන අතර සෙ. මී. 37 ක් ගැඹුරට හාරා පතුළ සමතලා කර තිබේ. මෙම සිදුරේ ස්වාභාවය අනුව මෙම ස්ථානයේ ගල් කුළුණක් තිබුණා විය හැකිය. කැපුම් සිදුර සහිත ගලේ සිට එයට සෙ. මී. 50 ඉහළින් ගල් තලාවේ දෙකෙලවර දක්වා දිවෙන සෙ. මී. 117 දිග හා ගැඹුර සෙ. මී. 11 කින් යුතු කැපුම් සලකුණෙහි මෙම සලකුණ උඩු අතට විවෘත වේ.

ඉහත සඳහන් ගලේ වම් කෙලවර බැවුම් සහිත ස්ථානයේ පියගැට දෙකක ස්වරූපයෙන් කැපුම් සලකුණු දෙකකි. සෙ. මී. 36 ලම්බාකාරව කපා හරස් අතට නැවත සෙ. මී. 33 ක් ගොස් ලම්බකව සෙ. මී. 18 ක් ගමන් කර අවසානයේ සෙ.මී. 26 ක් හරස් අතට සිටනසේ මෙම කැපුම යොදා ඇත. මින් මූල් කැපුම සෙ. මී. 46 ක් දල දෙවැන්න සෙ. මී. 57 ක් ද උඩු අතට යන පරිදි දිගට හාරා තිබේ. මෙම කැපුම් සහිත ගලේ සිට ඔය මධ්‍යයේ පිහිටි විශාල ගල් තලාවේ දකුණු කෙලවරට මීටරි 5. 61 ක දූරක් තිබෙන අතර ඒ දක්වා විහිදෙන උඩු අතට විවෘත කැපුම් සලකුණු පෙලක් දක්නට ඇත. මූලින් සඳහන් කැපුම් සලකුණේ පමළ කෙලවරින් ඇරඹෙන මෙම සලකුණ සෙ. මී. 180 ක් ගිය තැන ගලෙි ස්වාභාඩික සිහිටීම අනුව කැඩී තිබෙන අතරල ඉන් සෙ. මී. 8 ක පමණ දූරකින් නැවත ඇරඹී දකුණු දෙසට සෙ. මීත 108 ක් ගමන් කරයි. මෙම කැපුමේ ගැඹුර සෙ. මි. 9 ක් පමණ වේ. කෙලවර සෙ. මී. 43 ක් දිග සෙ. මී. 22 ක් පළලහා සෙ. මි. 20 ක් ගැඹුර සිදුරකි. එය සම්පූර්ණයෙන් ම උඩු අතට විවෘත වේ. එහි වම් කෙලවර කැපුම සෙ. මීත 22 ක් ඉහළට ගොස් කෙලවරින් නැවත ඇතුල් දෙසට අංශක 140 ක පමණ කෝණයකින් යුතුව හරවා සෙ. මි. 50 පමණ සිටින සේ යොදා තිබේ. මෙහි ගැඹුර සෙ. මීත 14 කි.

මූලින් සඳහන් සිදුරේ දකුනු දෙසින් සෙ. මීත 9 ක් පමණ ඉහළින් අරඹෙන කැපුමේ රේඛාව නැවත සෙ. මීත 150 දූරට පිහිටා තිබේ. මෙම කැපුමේ තැඹුර සෙ. මීත 15 සිට 17 දක්වා වෙනස්වන ස්වාභාවයෙන් යුක්තය. කැපුම් සලකුණ අවසාන වන්නේ කපා සකසා යොදා තිබෙන

ගල් පුවරුවකිනි. එම ගල් පුවරුව ස්වාභාවික ගල් තලාවේ කාණුවක ස්වාභාවයෙන් යුතු ස්ථානයකට නොව හිරකර තිබෙන අතර මුලින් සඳහන් කැපුම් රේඛාව ඒ මතින් සෙ. මී. 71 ක් ගමන් කර විශාල පර්වතයේ දකුණු කෙළවරින් නිමාවේ. කැපුම් සලකුණු අඛණ්ඩව යෙදීමට ඇති නොහැකියාව හේතුවෙන් එම ස්ථානය එක මට්ටමකට ගෙන ඒම සඳහා සකස් කරවන ලද ගල් පුවරුවන් යොදා ඇත. අමුණේ නිශ්චිත ස්ථානයක දැනට ඉතිරිව තිබෙන සකස් කරන ලද එකම ගල් පුවරුව මෙය වේ. (ඡායාරූපය 5)

පූර්ණ වහයෙන් මීටර් 6. 10 ක් පමණ දිගකින් යුතු මෙම කැපුම් සලකුණ උඩු අතට විවෘතය. අමුණේ ගල් පුවරු රඳවාලීමට අවශ්‍ය පාදම මෙම ස්ථානයෙන් ආරම්භ වී ඇත. ඇතුළු දෙසට කැපුමක් සිටින සේ සකස් කරන ලද ගල් පුවරු මෙම කුපිමු රේඛාව හා සම්බන්ධ කරලීමෙන් සාර්ථක ලෙස රඳවාලීම කළ හැකි බැවින් ඒවා ගැලවියමෙ වැළකේ. මෙහි සිදුරක් ලෙසින් තිබෙන ස්ථානයේ උසාති ගල් කුළුණක් රඳවාලීම කළා විය හැකිය. එම කුළුණ දෙපසට ගල් පුවරු හිරකරලීම නිසා අමුණේ විරුද්ධ අතට දිවෙන අමතර ශක්තියක් ලැබීමට තිබෙන අවකාශය වැඩි වේ.

අමුණේ නිර්මාණාත්මක ව්‍යුහය පිළිබඳව නිගමනවලට පැමිනීමට ඇති ප්‍රධාන අපහසුව වන්නේ එහි සම්පූර්ණයෙන්ම වාගේ විනාශ වී ගොස් තිබීමට. පුරණ සූකර නිජ්ජර අමුණේ නිර්මාණාත්මක ව්‍යුහය හා සසඳන විට අමුණු දෙකේ කැපුම් සලකුණුවල සමානත්වයක් දක්නට නොලැබේ. සූකර නිජ්ජර අමුණේ එය වඩාත් ගැඹුරට විහිද නොයන අතර ගලේ මතුපිට සුළු කොටසක් කඩා ඉවත් කර සකසා තිබේ. එහෙත් මෙම ස්ථානයේ කැපුම් සලකුණු වඩාත් ගැඹුරු ලෙසට කර ඇත. එයින් පැහැදිලි වන්නේ මෙහි ගල් රඳවාලීම වඩාත් උවමනාවෙන් කල බවකි. මෙම සලකුණ ගැඹුර සෙ. මී. 13–16 දක්වා ප්‍රමාණයන්ගෙන් යුක්ත වන අතර පිටතට විවෘත වන කැපුම් සලකුණ සෙ. මී. 15–20 දක්වා පළලින් යුක්තය.

දැඩි ප්‍රවාහයකින් ජලය ගලායන පටු ස්ථානයක මෙවැනි නිර්මාණ කිරීමේ දී එහි ශක්තිමත් බව කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කැපුම් සලකුණු වඩා ගැඹුරට හැරීම හා බරැති විශාල ගල් යෙදීම කරන්නට ඇත. (ඡායාරූපය 2). සූකර නිජ්ජර අමුණේ බඳිමයෙන් ගල් රඳවාලීමට ගත් උත්සාහය පැහැදිලිව දැකිය හැකි අතර මෙම ස්ථානයේ එවැනි සාධක නොමැත. බදාම උපයෝගිත්වයෙන් රවා තබනවාට වඩා කැපුම් සලකුණුවලටම ගලින් ගල හිරකිරීමෙන් මෙම අමුණ ගොඩනගා ඇති බව පෙනේ.

<u>පුරාණ ඇළ මාර්ගය</u>

අමුණේ සිට මීටර් 80 ක් පමණ ඉහළින් අමුණෙහි ජලය කෙන්බිම් කරා ලබාගත් ඇළ මාර්ගය පිහිටා තිබේ (ඡායාරූපය 6). මෙය වර්තමානයේ දී .. කැප් ඇළ.. නමින් හැඳින්වේ. මෙම ඇළට එම නම යෙදී ඇත්තේ .. කැපුප වූ .. හෙවත් .. කපාපු ඇළ .. යන අදහසින් බව ප්‍රදේශවාසී මතයයි. දකුණු ඉවුරෙන් උතුරු දිශානුගතව ඇඹෙන මෙම ඇළ මාර්ගය ඔයේ මීටර් 300 ක්

පමණ ගියවිට තරමක් වයඹ දෙසට හැරී ගමන් කරයි. මෙම ඇලේ ආරම්භක ඉවුරු දෙපස බෙහෙවින් සෝදාපාළුවට ලක්වී ඇත. ඇලේ ආරම්භක ස්ථානයේ මතුපිට උපරිම පළල මීටර් 12. 40 වන අතර ඔයේ පතුල මට්ටමේ දී එය මීටර් 2. 40 කි මෙහි සාමාන්‍ය මධ්‍ය පළල මීටර් 6 වන අතර පතුලේ සිට ඉහළ මතුපිට දක්වා ඇලේ මධ්‍ය මීටර් 5 ක උසින් යුක්ත වේ.

මෙම ඇළ මාර්ගය වර්තමානයෙ දි සැතපුමක් පමණ දුර ගමන්කොට පලුගස් ඇළ හෙවත් කටුවන්නාව ඇළ නම් වූ ඇළ මාර්ගය හා සම්බන්ධ වේ. එතැන් සිට සැතපුමක් පමණ පහළට ගමන් කර වර්තමාන රිදීබැඳිඇල්ල අමුණට ඉහලින් නැවත දැදුරු ඔයට එකතු වේ. කැප් ඇළල පලුගස් ඇළට සම්බන්ධ වනතෙක් වූ ප්‍රමාණය ක්‍රමවත්ව කපා තිබෙන ආකාරය හඳුනාගත හැකිය. ඉවුරෙහි මද බෑවුමෙහි ස්වාභාවය හා පතුලේ සමතලා භාවය හොඳින් සුරැකී තිබෙන අතර ඉවුරු දෙක අතර පතුල මීටර් 6 ක පමණ පළලකින් යුක්ත වේ (ඡායාරූපය 7). එහෙත් පලු ගස් ඇළට සම්බන්ධ වූ අවස්ථාවේ සිට මෙම තත්වය වෙනස් වී ගොස් දැඩිව බාදනය වූ ස්වරූපයක් හඳුනාගත හැකිය.

පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ඉදිකරණ ලද තිලගුල්ලක වාපි හෙවත් තිලගුල් වැවට[1] මෙම අමුණෙන් ජලය ලබාගන්නට ඇතැයි නිකලස් විශ්වාස කරයි. [2] අභාවිතව ඇති මෙම වැව වර්තමානයේ තලගල්ලේ වැව නමින් හඳුන්වයිත මෙම අමුණින් එම වැවට ජලය ලබාගත් කෘතිම ඇළ මාර්ගවක සාධක වර්තමානයේ දි හඳුනාගත නොහැකිය. භූමියේ පිහිටීම අනුව ද තලගල්ලේ වැවට මෙම අමුණින් ජලය ලබා ගැනීම අසීරුය. එහෙත් චූල වංශයේ ඉතා පැහැදිලිව දක්වා තිබෙනුයේ මෙම අමුණින් ලද ජලය සූකර නිජ්ජර අමුණ තෙක් කෘෂි කර්මාන්ත කටයුතු කළ බවයි. [3] මේ අනුව මෙම අමුණ ඉදිකිරීමේ මූලික පරමාර්ථය වී ඇත්තේ ඒ අවට ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීමට අවශ්‍ය ජලය සපයා ගැනීමට බව පැහැදිලිය. වර්තමානයේ දි කැප් ඇළ නමින් හැඳින්වෙන මෙම අමුණෙන් අරඹෙන ඇළ මාර්ගයේ ගමන්මග අනුව දොරදන්තික අමුණේ පහළ ප්‍රදේශයට මෙමගින් ජලය  සපයා තිබෙන බව සනාථ වේ. මේ අනුව දොරදන්තික අමුණ අසන්නයේ සිට පුරාණ සූකර නිජ්ජර අමුණට ඉහලින් වූ වර්ග සැතපුම් 9 ක පමණ භූමි ප්‍රදේශයක් මේ නිසා වගා කරන්නට හැකි වූ බව අනුමාන කළ හැකිය.

<u>පුරාණ ජනාවාස</u>

අමුණ අවට භූමියෙහි ඉතා බහුල වශයෙන් ඉපැරණි ගඩොල් අවශේෂ හමුවේ. මෙ තත්ත්වය දැදුරු ඔයේ දකුණු ඉවුරේ පහළයාය හා වම් ඉවරේ වල්පාලුව යන ගම්මාන දෙකෙහි ඉතා පැහැදිලිව සැකිය හැකිය. පොළව මතුපිට සිට සෙ. මී. 40 ක් පහළින් මෙවැනි අවශේෂවල සාධක දැකගත හැකිය. විශේෂයෙන්ම වලවල්ල ළිංල ගෙපලවල් කැපීමේ දි හා ගඩොල් සඳහා පස් කැපීමේ දි මෙවැනි සාධක විශාල ලෙස හමුවී ඇත. මේ නිසා ඒවායේ විනාශය ද ඒ සමගම සිදුවේ. මෙම ප්‍රදේශයෙන් හමුවන ගඩොලක සාමාන්‍ය දිගල පළල හා ඝනකම සෙ. මී. 22◦20◦8 කි.

පතළයාය ගමෙන් පුරණ සාධක විශාල ලෙස ලැබෙන අතර වඩාත් වැදගත් වන්නේ මෙයින් ලැබුණු මොල්ඩින් ගඩොලය. මෙම ගඩොල මතුපිට අර්ධ වෘත්තාකාර වන අතර යට කොටස පැතලිය. මෙහි අර්ධ වෘත්තාකාර මතුපිට සෙ. මී. 48 ක පරිධියකින් යුක්ත වන අතර ගඩොලේ දිග සෙ. මී. 37 කි. ගඩොලේ පළල සෙ. මී. 26 කින් හා උස සෙ. මී. 18 කින් යුක්තය. මෙම සම්පූර්ණ ගඩොලට අමතරව මෙවැනි ගඩොල්වල කැඩී ගිය කැබලි දක්නට ලැබේ.

ඉහත සාධක වලට අමතරව පැරණි වළං කැබලිතිල උළු කැපලිති ද බහුල වශයෙන් හමුවේ. වළං කර්මාන්තයේ දී වළං තැලීම පිණිස භාවිතා කරනු ලබන ඉපැරණි අත්ගලක් අමුණ ආසන්න ස්ථානයකින් ලැබී ඇත. ගලෙන් කර තිබෙන මෙය සෙ. මී. 9 ක උසකින් හා සෙ. මී. 10 ක විශ්කම්භයකින් යුක්තය. මෙහි මැදින් ඇතුලට නැවී වක් වී ඇත. අමුණට ආසන්න ප්‍රදේශයේ ඇතැම් ස්ථානවලින් හමුවන වළං කැබිලිති බහුල ස්ථාන හා මෙම සාධකය අතර සම්බන්ධතාවය විමර්පනය කරන විට වළං නිෂ්පාදන මධ්‍යස්ථානයක් මෙම ප්‍රදේශයේ පැවැති බව අනුමාන කළ හැකිය.

අමුණේ සිට මීටර් **300** ක පමණ දුරින් වම් ඉවුරේ වෙහෙරහැරයාගම නමින් ගොඩැලි සහති භූමියක් ඇත. එහි ස්වභාවය අනුව පූජනීය ස්ථානයක් අතීතයේ දී මෙහි පැවැති බව අනුමාන කළ හැකිය. වර්තමානයේ දී විවිධ මානව ක්‍රියාකාරකම් නිසා බෙහෙවින් විනාශ වී ගොස් තිබෙන මෙම ස්ථානයේ කැඩී ගොස් තිබෙන ගල් කණු දෙකක් පමණක් දැකගැනීමට පිළිවන.
මෙම සියළු සාධක ක්‍රි. ව. 11-12 සියවස්වල නිර්මාණාත්මක ලක්‍ෂණ වලින් යඅක්ත බව පෙනේ. මෙවැනි සාධක මගින් අමුණේ කාලනිර්ණය සම්බන්ධයෙන් කිසියම් අවබෝධයක් ලබාගත හැකිය.

අමුණ ආසන්නයෙන් ලැබෙන මෙවැනි සාධකවලින් තහවුරු වන්නේ අතීතයේ දී මෙම ප්‍රදේශය ජනාවාසව පැවැති බවයි. පුරාණ නිවාස ඉදිකිරීම් සම්බන්ධාන් සාධක හමුනොවෙතත් ස්ථාවර ගොඩනැගිලි පිහිටුවීම සම්බන්ධයෙන් තොරතුරු ලැබීම මගින් ප්‍රදේශයේ ජනාවාස වීම සම්බන්ධයෙන් කිසියම් ඉගියක් ලබාගත හැකියත පුරාණ ඇළ මාර්ගය දෙපස සිට තැනිතලා භූමිය පිහිටා තිබේ. ඇළ මාර්ගය ඔස්සේ ජලය සැපයෙන කාලයේ දී මෙම තැනිතලා භූමිය තෙත්බිම් වශයෙන් පවත්වාගෙන යන්නට ඇත. ඇතැම් ස්ථානවල තිබෙන උස්සම භූමි පුරාණ ජනාවාස පැවැති ස්ථාන ලෙස හඳුනාගත හැකි වේ. මේ සඳහා වන ප්‍රධාන සාධකය වන්නේ තැන තැන විසිරී තිබෙන මැටි බඳුන් කැබලිය.



දෝරදත්තික පුරාණ අමුණ ඉදිකර තිබුණ ස්ථානය



ජලය යටින් දිස්වන අමුණේ ගල් ඇතුරුම හා කැපුම් සලකුණ




අමුණ ඉවුරට සවිකිරීමට වම් ඉවුරේ ස්වභාවික ගලේ කපන ලද සලකුණු




අමුණ ඉදිකිරීමට යොදාගත් කැපුම් සලකුණ සහිත විශාල ගල් කුට්ටියක්



අමුණට ඉහලින් පුරාණ ඇළ මාර්ගය ආරම්භවන ස්ථානය





දෝරදත්තික අමුණ පිහිටි ස්ථානය හා ඇළ මාර්ගයේ ආරම්භය



දෝරදත්තික අමුණ සහ පුරාණ ඇළ මාර්ගය


©C.R. Withanachchi 2001

1. මගුරු ඔය
2. දැදුරු ඔය
3. කිඹුල්වානා ඔය
4. දෝරදත්තික අමුණ
5. පුරාණ ඇළ මාර්ගය
6. [illegible]
7. [illegible] වර්තමාන අමුණ
8. වර්තමාන ඇළ මාර්ගය
9. [illegible]
10. [illegible]



දෝරදත්තික අමුණ පිහිටි ස්ථානයේ ඔය අභ්‍යන්තරයේ ස්වභාවික ගල් තලාවේ කරන ලද කැපුම් සළකුණු

©C.R. Withanachchi 2001




දෝරදත්තික අමුණ පිහිටි ස්ථානයේ ඔය අභ්‍යන්තරයේ
ස්වභාවික ගල් තලාවේ කරන ලද කැපුම් සළකුණු

©C.R. Withanachchi 200